## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ පර්යේෂණ සහකාර III ශ්‍රේණිය තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2024 වර්ෂය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2018.01.04 දිනැතිව අනුමත කරන ලද දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියෙහි විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ පර්යේෂණ සහකාර III ශ්‍රේණිය තනතුරෙහි පවත්නා පුරප්පාඩු **03ක්** සම්පූර්ණ කිරීම සඳහා විවෘත පදනම මත බඳවා ගැනීමේ තරග විභාගය සඳහා පහත සඳහන් සුදුසුකම් සහිත අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. සුදුසුකම් :

1.1 *අධ්‍යාපන සුදුසුකම්* :

(*අ*) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

(*ආ*) රසායන විද්‍යා හා භෞතික විද්‍යා විෂයන් දෙක සහිතව භෞතික විද්‍යා විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත් ව තිබීම;

*හෝ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඉංජිනේරු තාක්ෂණවේදය ඇතුළුව තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම.

1.2 *වෘත්තීය සුදුසුකම්* :

ක්ෂේත්‍රයට අදාළ වන්නාවූ පහත සඳහන් පාඨමාලා වලින් එක් පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතිකයක් ලබා තිබීම.

i. මොරටුව විශ්ව විද්‍යාලය හා අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

ii. කැළණිය විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන ව්‍යවහාරික රසායන විද්‍යා එක් අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමාව සාර්ථකව නිම කර සහතික ලබා තිබීම. (Diploma in Applied Chemistry);

iii. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම;

iv. NVQ 06 මට්ටමට සමාන වන හෝ ඊට ඉහළ මට්ටමක පවතින ක්ෂේත්‍රයට අදාළ පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතිකය ලබා තිබීම.

1.3 *පළපුරුද්ද* : අදාළ නොවේ.

1.4 *කායික සුදුසුකම්* :

i. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය

1.5 *වෙනත් සුදුසුකම්* :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iii. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

iv. සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාග යට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු, අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

1.6 *වයස* :

අවම සීමාව : අවුරුදු 18ට නොඅඩු

උපරිම සීමාව : අවුරුදු 30ට නොවැඩි

02. පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව 03කි. එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ දී සම ලකුණු ලබා ගත් අයදුම්කරුවන්

පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 80 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය වේ.

03. **සේවා කොන්දේසි :**

3.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/EST/04-01-43/04/2017 හා 2018.01.04 දිනැතිව අනුමත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියෙහි ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම පටිපාටියට කර ඇති හෝ මින් මතු කරන සංශෝධන වලටද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2310/29 දරන හා 2022.12.14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලට ද යටත් වේ.

3.2 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

3.3 තමන් වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරී භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟ හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි බලය ඇත.

04. **මාසික වැටුප් පරිමාණය :**

2016.02.25 දිනැති 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 31,040- 10x455 - 11x660-10x730-10x750- රු. 57,550 (MT 03 -2016) වේ.

එනම් රු. 31,040 ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවනු ලැබේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛනයේ II හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* : ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

5.1 **ලිඛිත විභාගය :**

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 02 | 100 | 40% |

5.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

5.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

6. විභාග ගාස්තුව :

විභාග ගාස්තුව රු. 1000 කි. විභාග ගාස්තුව දුම්රිය සාමාන්‍යාධිකාරිගේ නමට මහජන බැංකුවේ ගිණුම් අංක : 176100129027313 දරන ගිණුමට බැර වන ලෙස ගෙවා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පෙර අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපතෙහි දාරයක් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

i. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.
ii. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

07. **අයදුම් කිරීමේ ක්‍රමය :**

(අ) අයදුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන් තම අත් අකුරින් ම අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ. විභාගය සඳහා ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයන් විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත (ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) **2024.06.10** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය.

දුම්රිය සාමාන්‍යාධිකාරී
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය
තැ. පෙ. 355, ඕල්කොට් මාවත
කොළඹ 10

(ඇ) අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ පර්යේෂණ සහකාර III තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීමේ තරග විභාගය - 2024'' යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

08. **විභාගයට ඇතුළුවීම :**

(අ) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන්ට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අයදුම්කරුවකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවාගෙන පළමුවෙන් එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අයදුම්කරුවකුම අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රයේ මුල පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීති උල්ලංඝණය කළහොත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට /ඇයට සිදුවනු ඇත.

(ඇ) **අත්සන සහතික කිරීම :**

අයදුම්පතේ ද, විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන් සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන් ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර ගත යුතු ය.

***සටහන*** :- අයදුම්කරුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

09. **අයදුම්කරුගේ අනන්‍යතාවය :**

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර හෝ ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ :

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය

10. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

I. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ කවර හෝ අවස්ථාවක දී වුවද ඇයගේ හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

II. අපේක්ෂකයකු විසින් සපයනු ලබන තොරතුරු පසු කලෙක දී වැරදි බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහු හෝ ඇය වෙත පත්වීමක් ලබාදීම සම්බන්ධයෙන් තවදුරටත් සලකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතුකොටගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුවද යටත් වේ.

11. **විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :**

11.1 විභාග මාධ්‍යය :

I. මෙම විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

***සටහන*** :

a. අයදුම්කරුවකු විභාගයේ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකටම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.
b. තම අයදුම්පතෙහි සඳහන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අයදුම්කරුවකුට අවසර දෙනු නොලැබේ.

11.2 **විභාග ප්‍රතිඵල :**

I. මෙම විභාගයේ ප්‍රතිඵල ලිඛිත විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ විභාග ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ http://www.railway.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට හෝ කටයුතු කරනු ඇත.

II. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ.

11.3 විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| *විෂයයන්* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, සිද්ධි විශ්ලේෂණය කිරීමේ හැකියාවත්, තීරණ ගැනීමේ හැකියාවත් පරීක්ෂා කෙරේ. |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | යන්ත්‍ර සූත්‍ර හා උපාංගවල අඩංගු ලෝහ වර්ගවල සංයුතිය සම්බන්ධ ගුණාත්මක හා ප්‍රමාණාත්මක විශ්ලේෂණයන් පිළිබඳ දැනුම සහ Destructive සහ non destructive පරීක්ෂණ, රසායනික හා භෞතික පරීක්ෂණ හා විද්‍යාත්මක මූලධර්ම මත පදනම් වූ ප්‍රායෝගික විෂයයන් හා සම්බන්ධ තාක්ෂණ ඥානය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ. |

12. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට ද, මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව තීරණ ගැනීමට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

13. සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

දුම්රිය සාමාන්‍යාධිකාරී.

දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය,
තැ. පෙ. 355, ඕල්කොට් මාවත,
කොළඹ 10.

2024 අප්‍රේල් මස 08 වැනි දින.